// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 1929/12 - 2015 අගෝස්තු මස 25 වැනි අඟහරුවාදා - 2015.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම්

නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර කලුපගේ ඔස්ටින් ප්‍රනාන්දු වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 F (1) හා (5) වැනි ඡේදයන් යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මා විසින් පත්කරන ලද හා මාගේ නියමයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1905/05 හා 2015.03.09 වන දින *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, නැගෙනහිර පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු හා නැගෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු වන ගරු ඊබ්‍රාහිම් මොහමඩ් මොහමඩ් මන්සූර් යන අය 2015.08.21 වැනි දින මා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලා අස්වීමේ ලිපිය අනුව ඔහු මින් ඉදිරියට නැගෙනහිර පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස කටයුතු නොකරන බවත්, පුරප්පාඩු වූ එම අමාත්‍ය ධුරය සඳහා ස්ථිර පත්කිරීමක් සිදුකරන තෙක් නැගෙනහිර පළාත් සභාවේ මන්ත්‍රී හා ප්‍රධාන අමාත්‍ය ගරු අහමඩ් නසීර් සෙයිනුලාබ්ඩීන් යන අය විසින් එම අමාත්‍යාංශයට අදාළ බලතල හා රාජකාරී කටයුතු තාවකාලිකව ඉටුකරන බවත් මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඔස්ටින් ප්‍රනාන්දු,
ආණ්ඩුකාරවර,
නැගෙනහිර පළාත.

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
නැගෙනහිර පළාත,
ඔර්ස් හිල්,
ත්‍රිකුණාමලය.
2015 අගෝස්තු මස 25 වැනි දින,

09-182

1A - PG 2587 — 08 (2015/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*